කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදි (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2012

2015 පෙබරවාරි

## BCOME 4554 - කාර්මික නීතිය

ප්‍රශ්න සංඛ්‍යාව - 08 කාලය - පැය 03

ප්‍රශ්න පහකට ( 05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. " වැඩ ඉටු කිරීමේ ආකාරය පාලනය කිරීම, යම් ගිවිසුමක් සේවා ගිවිසුමක් ද නැතහොත් සේවය සැපයීම සඳහා වූ ගිවිසුමක් ද යන්න තීරණය කිරීමට ඇති එකම මිණුම් දණ්ඩ නොවන බව මෑතකදී තීරණය කරන ලද නඩු තීන්දු වල ප්‍රකාශ කර තිබේ." සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

02. අ. කාර්මික ආරවුල් නිරාකරණය කිරීම සම්බන්ධයෙන් 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනතේ දක්වා ඇති ක්‍රම මොනවාදැයි නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ආ. සමථකරණය සහ ස්වේච්ඡා බේරුම්කරණය අතර ඇති සමාන අසමානකම් ගෙන හැර දක්වන්න.

( ලකුණු 08)

(මුළු ලකුණු 20)

03. 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනතේ දක්වෙන විධිවිධාන වලට අනුව සේවායෝජකයෙකු සතු ප්‍රධාන වගකීම් මොනවාදැයි සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

04. අ. රාජ්‍ය සේවකයන්ගේ වෘත්තිය සමිති ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් බලපාන විශේෂ සීමා කිරීම් මොනවාද ?

(ලකුණු 10)

ආ. ලියාපදිංචි කරනු ලැබූ වෘත්තිය සමිති වලට හිමි අයිතිවාසිකම් , මුක්තීන් හා වරප්‍රසාද මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. අ. 1941 අංක 27 දරණ පඩිපාලක සභා ආඥා පනත ඇති කිරීමේ අරමුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ. වැටුප් ගෙවීම හා වාර්තා පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් පඩිපාලක සභා ආඥා පනතේ අඩංගු විධිවිධානයන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ඇ. පඩිපාලක සභාවක් සංස්ථාපනය සහ එහි බලතල මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

06. අ. ශ්‍රී ලංකාවේ පාරිතෝෂික ගෙවීම පිළිබඳව ඓතිහාසික පසුබිම නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයන්ට පාරිතෝෂික ගෙවීම් සම්බන්ධයෙන් සේවායෝජකගේ වගකීමේ ස්වභාවය සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

07. අ. සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල අතර ඇති සමාන අසමානකම් දක්වන්න.

(ලකුණු 12)

ආ. සේවකයන්ට සෞඛ්‍ය සහ ආරක්ෂාව සැලසීම සම්බන්ධයෙන් 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනතේ සඳහන් විධිවිධාන මොනවා ද?

(ලකුණු 08 )

(මුළු ලකුණු 20)

08. අ. " වැඩ වර්ජනය කිරීමේ අයිතිය අප රටේ භාවිතා වන නීතිය විසින් පිළිගෙන ඇත." සාකච්ඡා කරන්න.

(ලකුණු 10 )

ආ. 1971 අංක 45 දරණ සේවානියුක්තිකයන්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන ) පනත යටතේ සේවායෝජකයෙකුගේ බැඳීම් කවරේ ද ?

(ලකුණු 10 )

(මුළු ලකුණු 20)